**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**චක්‍රලේඛය**

**2022 ජූලි 20** **2022 අංක 01**

# පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා සහන සැලසීම

පවතින සුවිශේෂී ආර්ථික තත්ත්වයන් හේතුවෙන් විවිධ ආර්ථික අංශවල නිරත වී සිටින ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝගවලට මුහුණ දීමේ අරමුණැතිව, බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට අවශ්‍යතා පදනමක් මත පහත සහන ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින්මතු බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත උපදෙස් ලබා දී ඇත.

මූල්‍ය පද්ධතිය මත ඇති විය හැකි ඕනෑම ඉහළ ආතතියක් වැළැක්වීම මගින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ස්ථාවරත්වය පවත්වා ගෙන යමින්, එක් එක් ණය ගිවිසුම් සලකා බැලීමේ පදනමින් ණය ගනුදෙනුකරුගේ නව ආපසු ගෙවීමේ ධාරිතාවන් මත පදනම්ව නිසි අයුරින් ණය ආපසු ගෙවීමේ වැඩපිළිවෙලක් යෙදීම සඳහා මෙම සහන පිරිනමනු ලැබේ. ඒ අනුව, සියලු බැංකු නොවන මූල්‍ය ආයතනයන් තුළ මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා විචක්ෂණ අවශ්‍යතා සමඟ සවිස්තරාත්මක මාර්ගෝපදේශ සැපයීමට මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. 2021 ඔක්තෝබර් 29 වන දින නිකුත් කරන ලද ලිපියට අනුව දැනටමත් පිහිටුවා ඇති පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක ඔස්සේ මෙම සහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව සියලු බැංකු නොවන මූල්‍ය ආයතන සලකා බැලිය යුතුය.

## 1. සක්‍රීය ණය පහසුකම් සඳහා සහන

1.1 දැනටමත් කොවිඩ්-19 ණය සහන යෝජනා ක්‍රමයට යටත් වූ ණය ගනුදෙනුකරුවන් ඇතුළුව පවතින සුවිශේෂී ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ආදායම හෝ ව්‍යාපාරය අහිතකර ලෙස බලපෑමට ලක් වී තිබෙන පුද්ගලයන් හෝ ව්‍යාපාරවල (මින්මතු ණය ගනුදෙනුකරුවන් ලෙස හැඳින්වෙන) සක්‍රීය ණය පහසුකම් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සුදුසු සහන (එනම්, මුල් මුදල හෝ පොළිය සඳහා හෝ මුල් මුදල සහ පොළිය යන දෙකම සඳහා හෝ මුල් මුදලෙන් හෝ පොළියෙන් කොටසක් සඳහා ලබා දෙන සහන කාලය, ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම හෝ වෙනත් යම් සහනයක්) සැලසිය යුතු වේ. ණය ගනුදෙනුකරුගේ ණය ආපසු ගෙවීමේ නව ධාරිතාව/ හැකියාව මත පදනම්ව, මෙම චක්‍රලේඛයේ දිනයේ සිට මාස හයක කාලයක් සඳහා එක් එක් සිද්ධීන් සලකා බලමින් සංචාරක ක්ෂේත්‍රය, ප්‍රවාහනය සහ නිෂ්පාදන, සේවා, කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් වැනි ව්‍යාපාර ක්ෂේත්‍රවල නිරතව සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුළු නමුත් මෙම අංශ වලට පමණක් සීමා නොවී සියලුම ආර්ථික අංශයන්හි බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම සහන සැලසීමට අපේක්ෂිත ය.

1.2 කල්බදු මූල්‍යකරණ පහසුකම් පිළිබඳ සලකා බැලීමේ දී, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාවන්ට ගැළපෙන පරිදි, සාධාරණ පොළී අනුපාතිකයක් සහිතව දීර්ඝ කරන ලද භුක්ති කාලයක් සමඟ, පවතින ණය පහසුකම හෝ

පහසුකම්වල ගිවිසුම්ගත වාරික වටිනාකම නොඉක්මවන ණය ආපසු ගෙවීමේ සැලැස්ම ව්‍යුහගත කිරීමට යාන්ත්‍රණයක් සැලසුම් කළ යුතුය. වෙනත් ණය පහසුකම් පිළිබඳ සලකා බැලීමේ දී, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ආපසු ගෙවීමේ සැලැස්ම ව්‍යුහගත කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැලසුම් කළ යුතුය.

1.3 සහනයක් ලෙස සහන කාලයක් ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන්, මෙම චක්‍රලේඛය යටතේ සහන කාලය සඳහා අදාළ වන පොලී අනුපාතිකය සියයට 20 හෝ සහන කාලය සලකා බැලීමට පෙර භාවිත කරන ලද ගිවිසුම්ගත පොලී අනුපාතිකයට සියයට 5 ක අගයක් එකතු කළ පසු අගයෙන් අඩු අගය නොඉක්මවිය යුතු අතර, සහන කාලය සඳහා සලකා බලන අගය මත පමණක් අය කළ යුතුය.

## 2. පූර්ව පියවීම සඳහා පහසුකම් සැලසීම

2.1 ඕනෑම ණය ගනුදෙනුකරුවෙකු විසින් පවතින ණය පහසුකම් සම්පූර්ණයෙන් පියවීමට අපේක්ෂා කරන අවස්ථාවක දී, එවැනි ණය ගනුදෙනුකරුවෙකුගෙන් පූර්ව පියවීමේ ගාස්තු, අනාගත පොලිය අය කර ගැනීම වැනි කිසිදු අතිරේක ගාස්තුවක් අය කිරීමකින් තොරව, එලෙස සිදු කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

2.2 ණය පහසුකම් පූර්ව පියවීමට කැමැත්තක් දක්වන ඕනෑම ණය ගනුදෙනුකරුවෙකු විසින් 2022.09.30 දින හෝ ඊට පෙර අදාළ බැංකු නොවන මූල්‍ය ආයතනය වෙත ඉල්ලීමක් සිදු කළ යුතුය.

## 3. අක්‍රීය ණය පහසුකම් සඳහා සහන

3.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි පුද්ගලයන් සහ ව්‍යාපාර/ ව්‍යාපෘතිවල අනාගත ණය ආපසු ගෙවීම් ධාරිතාව/ හැකියාව සලකා බලමින්, එක් එක් සිද්ධීන් සලකා බලමින් මුල් මුදල හෝ පොලිය හෝ මුල් මුදල සහ පොලිය යන දෙකම හෝ මුල් මුදල හෝ පොලියෙන් කොටසක් සඳහා සහන කාලයක් ලබා දීම, ප්‍රතිව්‍යුහගත කිරීම හෝ වෙනත් සහන වැනි සුදුසු සහන සැලසීම පිළිබඳ සලකා බැලිය යුතුය.

3.2 අක්‍රීය ණය පහසුකම් සඳහා ලබා දුන් සහන කාලය මත සහන සඳහා අදාළ වන පොලී අනුපාතිකය, සියයට 20 හෝ සහන කාලය සලකා බැලීමට පෙර භාවිත කරන ලද ගිවිසුම්ගත පොලී අනුපාතිකයට සියයට 5 ක අගයක් එකතු කළ පසු අගයෙන් අඩු අගය නොඉක්මවිය යුතුය.

3.3 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරුවන්ට කාලීනව ණය ආපසු ගෙවීම සකස් කර ගැනීමට හැකි වන පරිදි, 2020.01.01 දින හෝ ඉන් පසු අක්‍රීය ලෙස වර්ග කර ඇති කල්බදු වත්කම් බලෙන් අත්පත් කර ගැනීම හෝ යළි අයිතිය හිමි කර ගැනීම 2022.12.31 වන දින තෙක් අත්හිටුවිය යුතුය.

3.4 බැංකු නොවන මූල්‍ය ආයතනයක් විසින් කල්බදු වත්කමක් යළි අත්කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා කටයුතු ආරම්භ කර ඇත්නම් හෝ දැනුම් දීමක් සිදු කර ඇත්නම්, සලකා බලන බැංකු නොවන මූල්‍ය ආයතනය සහ ණය ගනුදෙනුකරු අතර ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට

එළඹීමේ කොන්දේසිය මත, එවැනි යළි අත්කර ගැනීමේ ක්‍රියාමාර්ග 2022.12.31 වන දින තෙක් අත්හිටු විය යුතුය

3.5 සලකා බලනු ලබන බැංකු නොවන මූල්‍ය ආයතනය සහ ණය ගනුදෙනුකරු ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළඹීමේ කොන්දේසි මත, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022.12.31 දින දක්වා එවැනි ණය සහ අත්තිකාරම් නැවත අය කර ගැනීම සඳහා වන නව තීරණ සම්මත කිරීම ප්‍රමාද කළ යුතුය. නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා වන තීරණ දැනටමත් සම්මත කර ගෙන ඇති අවස්ථාවලදී, කල්බදු වත්කම අත්පත් කර ගැනීම සහ යළි අයිතිය හිමි කර ගැනීම 2022.12.31 වන දින තෙක් අත්හිටු විය යුතුය.

3.6 කෙසේ වෙතත්, සිතාමතා ණය පැහැර හරින්නන්, වෙනත් අරමුණ සඳහා අරමුදල් යෙදවීම, මුදල් අවභාවිතය, වැරදි කළමනාකරණය සහ/ හෝ වංචා සහ ශක්‍යතාවයකින් තොර ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම හේතුවෙන් ණය පැහැර හැරීම් සිදු ඇති ගනුදෙනුකරුවන් මෙම සහන සඳහා සලකා බලනු නොලැබේ.

3.7 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරු අධික වශයෙන් සම්බන්ධ කර ගැනීම, හමු වීම/ ණය ආපසු ගෙවීම සඳහා බල කිරීමකින් තොරව දෛනික රැස් කිරීමේ ක්‍රියාවලිය/ ණය ආපසු අය කර ගැනීම අඛණ්ඩව සිදු කළ හැකිය.

## 4. ණය තොරතුරු කාර්යාංශය වෙත වාර්තා කිරීම

4.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් හුදෙක් ම අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ වාර්තා මත පමණක් පදනම්ව ණය ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන නව ණය පහසුකම් සඳහා ඉල්ලීම් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

4.2 අවශ්‍ය වන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන වාර්තා කිරීම සඳහා ණය තොරතුරු කාර්යාංශයේ උපදේශනය සහිතව, වාර්තාකරණ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

## 5. ගිණුම් තැබීම

5.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සහන සඳහා සලකා බලන ණය පහසුකම්වලට අදාළ ගිණුම් තැබීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කළ යුතුය.

5.2 මේ හා සම්බන්ධව අතිරේක මඟපෙන්වීමක්/ පැහැදිලි කිරීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් සහ විගණකවරුන්ගෙන් ලබා ගත හැකිය.

## 6. සහනවල විනිවිදභාවය

6.1 සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් ඉහත සහන ලබා ගැනීමට සිදු කරන ඉල්ලීම් ලිඛිතව හෝ විද්‍යුත් ක්‍රමවේදයන් ඔස්සේ 2022 අගෝස්තු 15 හෝ ඊට පෙර සිදු කළ යුතුය.

6.2 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරු සිදු කරන ඉල්ලීම ලැබීමෙන් මාසයක කාලයක් ඇතුළත එය පිළිගන්නේ ද නැතහොත් ප්‍රතික්ෂේප කරන්නේ ද යන වග තීරණය කළ යුතු අතර, එම තීරණය පිළිබඳ ණය ගනුදෙනුකරු නිසි ලෙස දැනුවත් කළ යුතුය**.**

6.3 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගෙවීම් ප්‍රමාද කිරීමේ ව්‍යුහය හෝ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ අදාළ වන පොලී අනුපාතිකය සම්බන්ධව ණය ගනුදෙනුකරුගේ අනුමැතිය සහ කැමැත්ත ලබා ගැනීමට පෙර, ණය ගනුදෙනුකරු දැනුවත් කරන බවට සහතික විය යුතු අතර ණය ගනුදෙනුකරුගේ අනුමැතිය සහ කැමැත්ත ලිඛිතව හෝ විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ ලබා ගත යුතුය.

## 7. වාර්තා කිරීමේ අවශ්‍යතාව

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022 අගෝස්තු 31 වන දින සිට වැඩ කරන දින 15ක් ඇතුළත, සෑම මසකම අවසාන දිනට ණය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන සහ සහන සඳහා ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ විස්තර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. වාර්තා කිරීමේ ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

අත්සන් කළේ,

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**
*මුදල් මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*